# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1986 අංක 10 දරන ශ්‍රී ලංකා සුමිත්‍රයෝ (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1986 අප්‍රේල් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : ශත 60 යි තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 10 දරන ශ්‍රී ලංකා සුමිත්‍රයෝ (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින.]

එල්. ඩී.—ඕ. 35/84

## ශ්‍රී ලංකා සුමිත්‍රයෝ සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"බිෆ්‍රෙන්ඩර්ස් ඉන්ටර්නැෂනල්" සංවිධානයේ ශාඛාවක් වශයෙන්, පාරිශ්‍රමිකයකින් තොරව වැඩ කරන ස්වේච්ඡා සේවක යන්ගෙන් සමන්විත වූ "ශ්‍රී ලංකා සුමිත්‍රයෝ" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව ඒ සංගමයට අදාළ සියලු පරමාර්ථ සහ කාරණා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද :

ඒ සංගමය පිහිටුවනු ලැබුවේ කවර පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා ඒ සංගමය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කොට සහ ඉටු කොට ඇති හෙයින් ද ඒ සංගමය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම් කොට ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1986 අංක 10 දරන ශ්‍රී ලංකා සුමිත්‍රයෝ (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සුමිත්‍රයෝ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ද මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා සුමිත්‍රයෝ" යන අභිධානය සහ නාමය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර, ඒ සංස්ථාව විසින් ද ඒ සංස්ථාවට විරුද්ධව ද ඒ නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට හා අළුත් කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. — ශ්‍රී ලංකා සුමිත්‍රයෝ සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— — සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බලාපොරොත්තු සුන් වූ හෝ විපතට පත් තැනැත්තන්ට ආධාර කිරීම සහ එවැනි තත්ත්වයන්ට පත් වූ තැනැත්තන්ට සංස්ථාවේ සාමාජිකයන්ගේ (මුදලින් හැර අන්‍යාකාරවලින්) උපකාරය, කරුණාව සහ මිත්‍රත්වය ලබා දීමෙන් එකී තැනැත්තන් අතර සිදුවන සියදිවි නසා ගැනීම්වල හා බලාපොරොත්තු සුන්වූ වෙනත් ක්‍රියාවල ප්‍රමාණය අඩු කිරීම ;

(ආ) බලාපොරොත්තු සුන් වූ හෝ විපතට පත් තැනැත්තන්ට සැනසීම, මිත්‍රත්වය, මාර්ගෝපදේශකත්වය, උපදෙස් සහ සහන ලබාදීම ;

ජ 076856—6,700 (84/05)

(ඈ) පිරිහුණු සහ අසරණ තත්ත්වයකට පත් ව සිටින්නා වූද සාමාන්‍ය සහ සාර්ථක දිවි පෙවෙතක් ගෙනයාම සඳහා සංස්ථාවේ සේවය පතන්නා වූ ද තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමට උපකාර කිරීම; සහ

(ඇ) ඉහත දැක්වෙන පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාවේ ශාඛා ශ්‍රී ලංකාවේ පිහිටුවීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල සංස්ථාවට ඇත්තේ ය :—

(අ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත යම් තැනැත්තන්ගෙන් හෝ නොහොත් පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමට ;

(ආ) කවර වුවද බැංකුවක ජංගම, ඉතිරි කිරීමේ සහ තැන්පතු ගිණුම් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට සහ සුදුසු යයි සංස්ථාව අදහස් කරන සුරැකුම්පත්වල සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමට ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට ;

(ඈ) පොලී ඇතිව හෝ නොමැතිව සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීමට ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට සහ එසේ පත් කරනු ලැබූ යම් නිලධරයකු හෝ සේවකයකු සේවයෙන් පහ කිරීමට සහ ඔහුට විරුද්ධව විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට ; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා සහ දේවල් කිරීමට.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

5. (1) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි තෝරා පත් කර ගනු ලබන, පත් කරනු ලබන හෝ එකතු කරගනු ලබන හා එකී රීතිවලින් නියම කර ඇති සංඛ්‍යාවකින් යුක්ත වූ පාලක සභාවක් විසින්, එකී රීතිවලට අනුකූලව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේ දී ධූර දැරූ සංගමයේ පාලක සභාව සංස්ථාවේ ප්‍රථම පාලක සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන්, කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධූරයෙන් නෙරපීම ;

(ආ) පාලක සභාවේ ධුර කාලය, පාලක සභාවට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම්, ඔවුන් තෝරා පත් කර ගත යුතු හෝ පත් කරගත යුතු ආකාරය, ඒ සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ඔවුන් ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ හැසිරීම ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ සහ පාලක සභාවේ රැස්වීම්වලදී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පැවැත්විය යුතු වේලාවල්, ස්ථාන සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් හා ඒවායේ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒවායේ දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(ඊ) පොදු වශයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක්, (1) වන ඡේදය යටතේ ඒ රීතිය සාදන ලද ආකාරයෙන්ම සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන අවස්ථාවේ දී පැවැති සංගමයේ සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සංගමයට අයවිය යුතු සියලු ණය සහ ඊට ගෙවිය යුතු සියලු දායක මුදල් හා සම්මාදම්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය. සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමය වෙත ගෙවිය යුතු ණය.

8. පාලක සභාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරයකු ඉදිරිපිටදී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය ඇත් අතර, ඒ දේපළ, විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සම්පූර්ණ බලය සහිතව, සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**විසුරුවා හැරීමෙන් පසු ශේෂවන දේපළ.**

**10.** සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු, සියලු ණය හා බැඳීම් ගෙවා නිදහස් කිරීමෙන් ඉක්බිති කවර වුවද දේපළක් ඉතුරු වී තිබුණ හොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතරේ බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද කිසිදු ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා ගැනීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් පුණ්‍ය ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දිය යුතු ය. නැතහොත් පැවරිය යුතු ය. ඒ ආයතනය හෝ ආයතන කවරේදැයි, සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට පෙර, සංස්ථාවේ සාමාජික යන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.